**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**නීතිවේදී උපාධි පාඨමාලාව – හයවන මට්ටම**
**දෙවන අඛණ්ඩ ඇගයුම් පරීක්ෂණය 2022/2023**
**දිලික්ත නීතිය – LWU 4326 / LLU6814**
**කාලය – පැය 1**

---

දිනය: 04-12-2023 වේලාව: ප.ව.3.30-4.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

විභාග ශාලාව තුල ඔබ සතුව අවසර නොලත් ලියැවිලි හෝ ජංගම දුරකථන තබාගැනීම විභාග වරදකි.

<u>එක්</u> ප්‍රශ්නයක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

1. "*res ipsa loquitur* නම් වූ ආප්තය හුදෙක් සාක්ෂි සම්බන්ධ රීතියක් පමණක් වන අතර, විත්තිකරුගේ නොසැලකිල්ල ඔප්පු කිරීමේ භාරයෙන් පැමිණිලිකරු නිදහස් වීමක් ඉන් සිදු නොවේ."

   *res ipsa loquitur* ආප්තයේ සංඝටක හා අධිකරණයේ එය අදාල නොවිය හැකි අවස්ථා පිළිබඳ නඩු නීතිය ඇසුරින් සාකච්ඡා කරන්න.

2. අජිත් සිය පෙම්වතිය වන මාලාව තම මෝටර් රථයෙන් රාත්‍රී සමාජ ශාලාවක් වෙත ගෙන ගියේය. රාත්‍රී සමාජ ශාලාවේ දී අධික ලෙස මත්පැන් පානය කළ අජිත් මාලාගෙන් වාහනය එලවන ලෙස ඉල්ලා සිටියේය. මාලා රිය පැදවීම ඉගෙන ගනිමින් සිටි අයෙකු වූ අතර ඇයට රියැදුරු බලපත්‍රයක් නොවීය. ඇයට රිය පැදවීමට අවශ්‍ය නොවූ නමුත්, ඇයට අතුල් පහරක් දුන් අජිත් ඇය රිය පැදවූයේ නැතිනම්, ඇයව තනි කොට තමුන් වාහනය ගෙදර ගෙන යන බවට තර්ජනය කලේය. පාන්දර 2ට පාරේ තනිවීමට බිය වූ මාලා රිය පැදවීමට එකඟ වූවාය. ගෙදර යන අතරතුර බල්ලෙක් පාර හරහා ගමන් කලේය. මාලා බල්ලා බේරා රිය පැදවීමට උත්සාහ කල අතර, එහි දී වාහනය ඇගේ පාලනයෙන් ගිලිහී ගහක හැප්පුණි. කොඳු ඇට පෙලෙහි ආබාධයකට ලක් වූ අජිත් මේ වනවිට ඔත්පල වී සිටියි. මාලාගේ පාද දෙකම කැඩුණු අතර මාස තුනක කාලයක් රෝද පුටුවක සිටීමට සිදු විය.

   තමාට සිදු වූ හානිය වෙනුවෙන් එකිනෙකාට එරෙහිව නඩු දැමීමට අජිත් හා මාලා අපේක්ෂා කරති. ඔවුන්ට උපදෙස් දෙන්න.

************************

හිමිකම් ඇවිරිණි